

CITY OF MONASH

# මොනෑෂ් ප්‍රජා ආධාර සහ හවුල්කාරිත්ව වැඩසටහන 2026/27

## අයදුම්පත් මාර්ගෝපදේශ

# අයදුම්පත් සම්බන්ධ විමසීම්

**මොනෑෂ් සම්බන්ධ ප්‍රජා කණ්ඩායම**
9518 3555
monash.grants@monash.vic.gov.au

# මොනෑෂ් භාෂණ පරිවර්තන සේවාව

ඔබට ඉංග්‍රීසි භාෂාවට වෙනස් භාෂාවකින් මොනෑෂ් ප්‍රජා ආධාර හා හවුල්කාරිත්ව වැඩසටහන් පිළිබඳව කෙනෙකු සමඟ කතා කිරීමට අවශ්‍ය නම්, කරුණාකර අපගේ භාෂණ උපකාරක දුරකථන අංකයකට ඇමතුමක් ලබා දෙන්න:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 普通话 | 4713 5001 | Việt Ngữ | 4713 5003 | हिंदी | 4713 5005 | 한국어 | 4713 5010 | தமிழ் | 4713 5021 |
| 廣東話 | 4713 5002 | Ελληνικά | 4713 5004 | Italiano | 4713 5008 | සිංහල | 4713 5020 | Other languages | 4713 5000 |

# දේශය පිළිබඳ පිළිගැනීම

මොනෑෂ් නගර සභාව මෙම භූමියේ සම්ප්‍රදායික හිමියන් සහ ආරක්ෂකයින් ලෙස වුරුන්ජේරි වෝයි වුරුන්ග් සහ බුනුරොං ජනතාව පිළිගෙන, ඔවුන්ගේ අතීත, වර්තමාන සහ ඉදිරියට පැමිණෙන ජ්‍යෙෂ්ඨයන්ට ගෞරව දැක්වයි.

# විවිධත්ව ප්‍රකාශය

මොනෑෂ් නගර සභාව සියලුම ප්‍රජාව සහ සේවකයින්ගේ විවිධත්වය සමරමින්, සියලු දෙනාට ආදරයෙන් පිළිගන්නා සහ සියළු දෙනා ඇතුලත් කර ගන්නා ස්ථානයක් වේ.

අපට අවශ්‍ය වන්නේ වයස, ජාතිය සහ වංශය, ලිංගය, ලිංග අනන්‍යතාවය සහ ලිංගිකත්වය, හැකියාවන්, ආගම සහ ආගමික විශ්වාස, අබෝරිජිනල් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත් ජනතාවගේ අනන්‍යතාවය, සහ/හෝ සමාජ-ආර්ථික තත්ත්වය යන අප අතර වෙනස්කම් නොසලකා, සෑම පුද්ගලයෙකුම ආරක්ෂිතබව, ගෞරවනීයබව සහ සැමරියහැකි බව හැඟෙන්නටය.

# මොනෑෂ් නගර සභාව – ළමුන්ගේ ආරක්ෂාවට ඇප කැපවීම

මොනෑෂ් නගර සභාව සියලුම ළමුන් සහ තරුණයන්ට වටිනාකමක් ලබාදෙන අතර, ළමුන්ගේ ආරක්ෂාව සඳහා ඇප කැපවූ ආයතනයක්වේ. මොනෑෂ් නගර සභාව ළමුන්ට එරෙහි වදහිංසනය කිසිදු ආකාරයකට නුරුස්නා අතර එවැනි චෝදනා සියල්ලම දරුණු ලෙස සලකයි. ළමුන් සහ තරුණයන් ආරක්ෂා කිරීම සෑම කෙනෙකුගේම වගකීමක් වන අතර, සියලුම ළමුන් සහ තරුණයන්ට ආරක්ෂිත සහ ඇතුලත්වූ ප්‍රජාවක් ගොඩනැගීමට මොනෑෂ් නගර සභාව ඇප කැපවී ඇත.

ළමුන් සහ තරුණයන් සමඟ කටයුතු සම්බන්ධ සිදු කරන සියලුම ප්‍රදාන ලබා ගැනීම සඳහාවූ අයදුම්පත් අදාල ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධ නීති සහ නියමයන්ට අනුකූල විය යුතුය.

# පටුන


| | |
|---|---|
| පිළිගැනීම | 5 |
| කාලසටහන් සහ ක්‍රියාවලිය | 6 |
| අපගේ ප්‍රදාන | 7 |
| වාර්ෂික ප්‍රදාන | 10 |
| බහු වාර්ෂික ප්‍රදාන – 2026 සිට 2029 | 12 |
| වසර පුරා අරමුදල් ලබාදීම | 14 |
| අයදුම්පතක් ඉදිරිපත් කිරීම | 15 |





ACADEMY

# පිළිගැනීම

**මොනෑෂ් ප්‍රජා ආධාර සහ හවුල්කාරිත්ව වැඩසටහන (The Monash Community Grants and Partnerships Program - MCGPP) මඟින් මොනෑෂ් ප්‍රජාව සඳහා ව්‍යාපෘති, ක්‍රියාකාරකම් සහ සිදුවීම් ක්‍රියාත්මක කිරීමට ප්‍රජා කණ්ඩායම් සහ සංවිධාන සඳහා මූල්‍ය ආධාර ලබා දේ. මෙය ප්‍රජාව ශක්තිමත් කිරීම, වර්ධනය කිරීම සහ ප්‍රයෝජනයක් ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක වේ**

කවුන්සිලය මගින් ප්‍රජාව තුළ සේවා ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම, සමාජ සබඳතා ගොඩනැගීම, ප්‍රාදේශීය ගැටළු විසඳීමට වැසියන්ට බලය ලබාදීම සඳහා ප්‍රජාව තුල ආයෝජනය කරයි. නැගී එන අවශ්‍යතා සඳහා ආධාර ලබාදීම, ඇතුළත්කිරීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්මාණාත්මක වැඩසටහන් සහ සිදුවීම් ඔස්සේ අපගේ විවිධ සංස්කෘතීන් සැමරීම සඳහා ප්‍රදාන ලබාදෙයි.

## මූලධර්ම

**MCGPP මඟින් මොනෑෂ් ප්‍රජාව ශක්තිමත් කිරීම සඳහා එහි ජනතාව මූලික කරගෙන ක්‍රියාත්මක වේ. මෙම මූල්‍ය ආධාරය මූලික මූලධර්ම තුනක් මත පදනම්ව මාර්ගෝපදේශනයවේ:**

### 1. හවුල්කාරිත්වය

අපගේ ප්‍රධාන අරමුණ වන්නේ සමාජ සමගිය වර්ධනය කිරීම, විවිධත්වය පිළිබඳ අපගේ අවබෝධය පුළුල් කිරීම සහ අපගේ ප්‍රජාව තුළ පවතින ශක්තිමත් ලක්ෂණ සහ සම්පත් මත පදනම්ව ගොඩනැගීමයි.

### 2. අන්තර්සංධිත්වය

අපි ප්‍රජාවේ අත්දැකීම් හැඩගස්වන විවිධත්වය, සංකීර්ණත්වය සහ අන්තර්සංධි සාධක හඳුනාගනිමු. සම්පූර්ණ සහ සක්‍රීය සහභාගිත්වයක් ලබා ගැනීම සඳහා පද්ධතිමය සහ සමාජමය බාධක ඉවත් කරන ක්‍රමවේදවලට අපි ප්‍රමුඛතාවය ලබාදෙමු, එමඟින් අන්තර්සංධි අවශ්‍යතා සඳහා ඇතුළත්කිරීම, ප්‍රවේශය සහ ප්‍රතිචාරකභාවය වර්ධනය කළ හැකිය.

### 3. සෞඛ්‍යය සහ සුබසාධන ප්‍රමුඛතා

කවුන්සිලය 2025-2029 සෞඛ්‍යය සහ සුබසාධන සැලැස්ම (MHWP) යටතේ ප්‍රමුඛතා කිහිපයක් හඳුනාගෙන ඇත. ඒවා වන්නේ:

- සෞඛ්‍ය සම්පන්න ආහාර පරිභෝජනය සහ සක්‍රීය ජීවිතයක් ගොඩනැගීම.
- ගෞරව සහිත සහ ආරක්ෂිත ප්‍රජාවක් ගොඩනැගීම.
- මානසික සෞඛ්‍යය සහ සමාජ සමගිය ශක්තිමත් කිරීම.
- කාලගුණ වෙනස්වීම් සහ එය සෞඛ්‍යය මත ඇති බලපෑම් හමුවේ ක්‍රියාත්මක වීම.
- සාධාරණ සහ ඇතුළත් ප්‍රජාවක් ප්‍රවර්ධනය කිරීම සහ සහාය වීම.

MHWP පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා monash.vic.gov.au/MHWP වෙත පිවිසෙන්න

# කාලසටහන් සහ ක්‍රියාවලිය

| | |
|---|---|
| **අයදුම්පත් විවෘත වීම** | **2026 ජනවාරි 27 අඟහරුවාදා, පෙ.ව. 9.00** |
| **තොරතුරු සහ සහාය සැසීන්** | 2026 ජනවාරි - පෙබරවාරි |
| **අයදුම්පත් වසා දැමීම** | **2026 මාර්තු 3 අඟහරුවාදා – ප.ව. 2.00** |
| **ඇගයීම** | 2026 මාර්තු - 2026 අප්‍රේල් |
| **අරමුදල් පිළිබඳ දැනුම්දීම** | 2026 ජූනි |
| **ව්‍යාපෘති ක්‍රියාත්මක වීම** | 2026 ජූලි 1 සිට – 2027 ජූනි 30 දක්වා |
| **වාර්තා සහ මුදල් වාර්තාකරණය** | 2027 ජූලි 1 සිට – 2027 අගෝස්තු 12 දක්වා |

## තොරතුරු සහ සහාය සැසීන්

අයදුම් කිරීමේ අදියර පුරා, අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා සහාය වීමට, විවිධ සහාය විකල්ප ලබා දෙනු ඇත:

- **තොරතුරු සැසීන්** මඟින් වැඩසටහනේ ව්‍යුහය පිළිබඳ සාරාංශයක්, මේ වසරේ හඳුන්වා දී ඇති ප්‍රධාන වෙනස්කම් සහ අයවැය සංවර්ධනය කිරීම පිළිබඳ පුහුණුවක් ඇතුලත් වනු ඇත.
- **වැඩමුළු** මඟින් අයදුම්කරුවන්ට තම ව්‍යාපෘතිය, එහි බලපෑම සහ ප්‍රතිඵල පැහැදිලිව විස්තර කිරීමට උපකාර වන ප්‍රධාන අයදුම් ලිවීමේ කුසලතා මත අවධානය යොමු කරනු ඇත.
- **තනි පුද්ගල සහාය සැසීන්** මඟින් කණ්ඩායම්වලට තම සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ ව්‍යාපෘති අදහස් නිරවද්‍ය කිරීම සඳහා තනි පුද්ගල සහාය ලබා දෙනු ඇත. සීමිත සංඛ්‍යාවක් වන මෙම සැසීන්හිදී මාර්ගගත අයදුම්පතක් සම්පූර්ණ කිරීමටද සහාය ලබා දෙනු ඇත.

අයදුම්කරුවන්ට මෙම සහාය අවස්ථා භාවිතා කිරීමට උනන්දු කෙරේ, එහෙත් එය අනිවාර්ය නොවේ.

සියලු සැසීන් සඳහා වෙන්කිරීම් අවශ්‍ය වන අතර, විස්තර වෙබ් අඩවියෙන් ලබා ගත හැක.
monash.vic.gov.au/community-grants

## ප්‍රදාන ඇගයීම

අයදුම්පත් ඉදිරිපත් කළ පසු, ඒවා සුදුසුකම් සඳහා සමාලෝචනය කරනු ලබන අතර, එක් එක් අරමුදල් ප්‍රවාහයට අදාළ මාර්ගෝපදේශ මත පදනම්ව කවුන්සිල නිලධාරීන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ඇගයීම සිදු කරනු ඇත.

එක් එක් අයදුම්පත ලබාගන්නා ලකුණු මත පදනම්ව නිර්දේශ සකස් කරනු ලබයි. මෙම නිර්දේශ මැයි 2026 කවුන්සිල රැස්වීමේදී සලකා බැලීම සහ අවසන් තීරණය සඳහා කවුන්සිලයට ඉදිරිපත් කරනු ලබයි.

**කරුණාවෙන් සටහන් කර ගන්න:**
නිදොස් කිරීම් සහ අරමුදල් ගිවිසුම් ආදී ප්‍රදාන ලියකියවිලි ඔබගේ කණ්ඩායම මීට පෙර නියමිත දිනයෙන් පසු ඉදිරිපත් කර තිබුණහොත්, ඔබට තවදුරටත් අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ. එහෙත්, සම්පූර්ණ අරමුදල ලබාදීමේ හැකියාව නොතිබිය හැක.

# අපගේ ප්‍රදාන

## වාර්ෂික අරමුදල් ලබාදීම

අයදුම්කරුවන්ට 2026 පෙබරවාරි මාසයේදී කුඩා, මධ්‍යම සහ විශාල වාර්ෂික මුදල් ප්‍රදාන සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත.

| කුඩා ප්‍රදාන | මධ්‍යම ප්‍රදාන | විශාල ප්‍රදාන |
|---|---|---|
| $5,000 දක්වා | $10,000 දක්වා | $20,000 දක්වා |

## බහු වසර ප්‍රදාන

2026 පෙබරවාරි මාසයේදී අයදුම්කරුවන්ට වසර 3ක් දක්වා නැවත නැවත ලබාදෙන අරමුදල් සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත.

| හවුල්කාරිත්ව ප්‍රදාන | ජ්‍යෙෂ්ඨ සමාජ ශාලා සඳහා සහාය | මොනෑෂ් ශාලා ප්‍රදාන |
|---|---|---|
| $85,000 දක්වා මුදල් | $5,000 දක්වා මුදල්<br>$30,000 දක්වා ශාලා භාවිතය සඳහා | $15,000 දක්වා ශාලා භාවිතය සඳහා |

## වසර පුරා අරමුදල් ලබාදීම

අයදුම්කරුවන්ට 2026 ජූලි 1 සිට 2027 මැයි 12 දක්වා, හෝ අරමුදල් අවසන් වන තෙක්, වසර පුරා අරමුදල් සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත

| සංස්කෘතික උත්සව සඳහා සහනාධාර | ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන |
|---|---|
| $1,000 දක්වා | $5,000 දක්වා |



# සුදුසුකම

## අයදුම් කිරීමට සුදුසුකම් ඇත්තේ කා හටද?

**අයදුම්කරුවෙකුට අරමුදල් සඳහා සුදුසුකම් ලැබීම තීරණය කරන සාධක කිහිපයක් තිබේ. එහෙත්, සියලුම අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන මූලික සුදුසුකම් අනිවාර්යයෙන් සැපිරිය යුතුය.**

- ලාභ අපේක්ෂිත නොවන හෝ ACNC තත්ත්වය ඇති, සංස්ථාපිත ලෙස ලියාපදිංචි වී ඇති ප්‍රජා කණ්ඩායමක් හෝ සංවිධානයක් විය යුතුය. නැතහොත් සුදුසුකම් ඇති සංවිධානයක් විසින් අනුග්‍රහය ලබා ඇති විය යුතුය
- වර්තමාන ABN තත්වය පවත්වාගෙන යාම.
- අරමුදල් ලබාදෙන ක්‍රියාකාරකම/සේවාව මොනෑෂ් සිටි සීමාවන් තුළ ක්‍රියාත්මක විය යුතුය.
- අවම වශයෙන් මිලියන $20ක මහජන වගකීම් රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යාම.
- කවුන්සිලය වෙත ණය හෝ ඉදිරිපත් කළ යුතු ලේඛන මඟ හැරී නොමැති විය යුතුය.
- කවුන්සිලයේ සමාජ සෞඛ්‍ය ක්‍රමවේදය සහ සූදුවට අදාල හානි ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය අතර විශේෂයෙන්ම විද්‍යුත් සූදු යන්ත්‍ර (electronic gaming machines (EGMs)) ඇති ස්ථානයක නිතර රැස්වීම් හෝ අරමුදල් ලබාදෙන ක්‍රියාකාරකම් නොපැවැත්විය යුතුය.
- වාර්ෂික වැඩසටහන යටතේ අයදුම්පත් දෙකකට වඩා අයදුම් නොකළ යුතු අතර මුළු මුදල $30,000ක මුදල් ප්‍රදානයක් නොඉක්මවිය යුතුය.

# ප්‍රමුඛ ජනගහණ කණ්ඩායම්

සෞඛ්‍යය සහ සුබසාධනය සම්බන්ධ කරුණු සෑම අයෙකුටම බලපෑවද, අපගේ සමාජයේ සියලුම පුද්ගලයන් හෝ කණ්ඩායම් සමාන අවස්ථා, දැනුම, කුසලතා සහ/හෝ සම්පත් ලබාගෙන ප්‍රශස්ත සෞඛ්‍යය සහ සුබසාධනයක් ලබා ගැනීමට සහ පවත්වා ගැනීමට හැකියාවක් නොමැත.

MHWP මෙම අසමානතා හඳුනා ගනිමින් ප්‍රමුඛතාවය දක්වන ජනගහණ කාණ්ඩ හඳුනාගෙන, ඔවුන්ගේ අවශ්‍යතා සෞඛ්‍යය සහ සුබසාධන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීමේ සියලු අදියරවලට ඒකාබද්ධ කරයි.

කවුන්සිලය මෙම විෂමතා විසඳීමට කැපවී ඇත. අපි, ප්‍රමුඛතාවය දක්වන ජනගහණ කාණ්ඩවල අනන්‍ය අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දක්වන, සියලු දෙනාට ඇතුළත් විය හැකි සහ ප්‍රවේශ විය හැකි ප්‍රදාන ඉල්ලීම් ඉදිරිපත් කිරීමට උනන්දු කරමු.

**පළමු ජාතික ජනතාව, බහු සංස්කෘතික සමාජ, ආබාධිත පුද්ගලයින් සහ ඔවුන්ගේ රැකබලාගන්නන්, තරුණයින් සහ දරුවන්, වයසක පුද්ගලයින්, LGBTIQA+ සමාජ සහ මූල්‍යමය වශයෙන් අවදානමට ලක්වූ පුද්ගලයින්.**

අපි ලිංග සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන, ලිංගමූලික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ, සහ ඇතුළත්කම, ආරක්ෂාව සහ ගෞරවය වර්ධනය කිරීමේ උත්සාහයන් සාදරයෙන් පිළිගනිමු. මෙම ප්‍රමුඛතා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සහ සෞඛ්‍යවත්, වඩා සම්බන්ධිත සහ සමානාත්ම මොනෑෂ් සමාජයක් සඳහා දායක වන ව්‍යාපෘති අරමුදල් ලබාදීමේදී ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

# අරමුදල් ලබාදිය නොහැකි ක්‍රියාකාරකම් මොනවාද?

**කවුන්සිලය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ලබාදිය නොහැක:**

- ප්‍රමාදව ඉදිරිපත් කරන අයදුම්පත්.
- ප්‍රාදේශීය පාලන ආයතනයේ ව්‍යාප්තියට අයත් නොවන ක්‍රියාකාරකම්, උදා: නිවාස, අධ්‍යාපනය
- පුද්ගලික නිවසක සිදු වන ක්‍රියාකාරකම්.
- දේශපාලනික අරමුණු සඳහා හෝ පුද්ගලයකුගේ දේශපාලන විශ්වාසවලට බලපෑමක් කිරීමේ අරමුණින් පැවැත්වෙන ක්‍රියාකාරකම්.
- විශේෂ ආගමික අරමුණු සඳහා හෝ පුද්ගලයකුගේ ආගමික විශ්වාසවලට බලපෑමක් කිරීමේ අරමුණින් පැවැත්වෙන ක්‍රියාකාරකම් (මෙයට වාර්ෂික ආගමික උත්සවයන් සඳහා පැවැත්වෙන ප්‍රජා උත්සව ඇතුළත් නොවිය හැක).

# අරමුදල් ලබාදිය නොහැකි කරුණු

- ස්ථිර තනතුරකට සේවකයන් බඳවා ගැනීම (හෝ අරමුදල් ලබාදෙන කාලසීමාවට වඩා දිගු ගිවිසුමක්).
- පර්යේෂණ.
- ආහාර සහන.
- වාණිජ අරමුණු සඳහා පමණක් යොදාගන්නා ක්‍රියාකාරකම්.
- අරමුදල් රැස් කිරීමේ ක්‍රියාකාරකම්.
- කවුන්සිලයේ අරමුණු සමඟ අනුකූල නොවන ක්‍රියාකාරකම්.
- සම්මේලන හෝ සම්මේලන අනුග්‍රහය.
- ණය ගෙවීම්.
- බස් කුලියට ගැනීම සහ මහජන ප්‍රවාහනය ඇතුළත් ගමන් වියදම්.
- පුද්ගලයකුගේ වියදම්.
- ප්‍රාග්ධන යටිතල පහසුකම්.
- ජලය, විදුලිය, ගෑස් සහ වරිපනම් බදු වැනි උපයෝගිතා.
- රක්ෂණය.
- මෝනෂ් හි දැනට පවතින සේවා හෝ වැඩසටහන් නැවත කිරීමේ ක්‍රියාකාරකම්.
- ත්‍යාග සහ දිනුම්.
- මත්පැන්.
- ටැබ්ලට්, පරිගණක, දුරකථන ඇතුලත් ඩිජිටල් උපකරණ.

# අයිතම සීමා

| අයිතමය | මුදල් සීමාව |
|---|---|
| **වත්කම් සහ උපකරණ** | $1,000 |
| **නිළ ඇඳුම් සහ ඇඳුම් පැළඳුම්** | $1,000 |
| **පරිපාලන වියදම්** | $250 |
| **අළෙවිකරණය සහ ප්‍රවර්ධනය** | $500 |
| **ආහාර සැපයීම** | මුළු මුදල් වෙන්කිරීමෙන් 20% ක් (ජ්‍යෙෂ්ඨ සමාජ ශාලා සහාය සඳහා ඉල්ලූ මුදලෙන් 75% ක්. |



# වාර්ෂික ප්‍රදාන

## කුඩා ප්‍රදාන

**ප්‍රජා සම්බන්ධතා සහ ඉගෙනීමේ අවස්ථා සෑදීම සඳහා වන කුඩා ව්‍යාපෘති සඳහා.**

- රු. 5,000 දක්වා මුදල් සඳහා අයදුම් කරන්න

## කුඩා අරමුදල් නිර්ණායන

1. සාක්ෂි මත පදනම් වූ ප්‍රජා අවශ්‍යතාවයක් ආමන්ත්‍රණය කිරීම (30%).
2. කවුන්සිලයේ සෞඛ්‍යය සහ සුබසාධන සැලසුමට අදාලව (15%).
3. ප්‍රයෝජනය ලබන මෝනෑෂ් වැසියන් සංඛ්‍යාව (20%).
4. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානයේ හැකියාව (20%).
5. අයවැය වියදම් (15%)

## මධ්‍යම ප්‍රදාන

**නව අදහස් පිළිගනිමින්, කවුන්සිලය මඟින් ලබාදෙන අරමුදල්වලින් එහාටත් ප්‍රජාව සඳහා තිරසාරව පවත්වාගෙන යා හැකි සේවා හැකියාව පෙන්වන විශාල සහ දිගුකාලීන ව්‍යාපෘති සඳහාය.**

- $10,000 දක්වා මුදල් ප්‍රදානයක් සඳහා අයදුම් කරන්න.

## මධ්‍යම ප්‍රදාන නිර්ණායන

1. සාක්ෂි මත පදනම් වූ ප්‍රජා අවශ්‍යතාවයක් ආමන්ත්‍රණය කිරීම (20%).
2. කවුන්සිලයේ සෞඛ්‍යය සහ සුබසාධන සැලසුමට අදාලව (15%).
3. නවෝත්පාදනය පෙන්වීම (10%)
4. ප්‍රයෝජනය ලබන මෝනෑෂ් වැසියන් සංඛ්‍යාව (15%).
5. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානයේ හැකියාව (10%).
6. අයවැය වියදම් (10%).
7. කවුන්සිලය මඟින් ලබාදෙන අරමුදල්වලින් එහා තිරසාරත්වය සඳහා පෙන්වන හැකියාව (10%).

# විශාල ප්‍රදාන

## ප්‍රජාවට වැදගත් බලපෑමක් ඇති විශාල පරිමාණයේ හෝ නවෝත්පාදන ව්‍යාපෘති.

» $20,000 දක්වා මුදල් ප්‍රදානයක් සඳහා අයදුම් කරන්න.

## විශාල ප්‍රදාන නිර්ණායන

1. සාක්ෂි මත පදනම් වූ ප්‍රජා අවශ්‍යතාවයක් ආමන්ත්‍රණය කිරීම (10%).
2. කවුන්සිලයේ සෞඛ්‍යය සහ සුබසාධන සැලසුමට අදාලව (15%).
3. ප්‍රයෝජනය ලබන මෝනෑෂ් වැසියන් සංඛ්‍යාව (15%).
4. නවෝත්පාදනය පෙන්වීම (10%).
5. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානයේ හැකියාව (15%).
6. අයවැය වියදම් (10%).
7. කවුන්සිලය මඟින් ලබාදෙන අරමුදල්වලින් එහා තිරසාරත්වය සඳහා පෙන්වන හැකියාව (10%).
8. ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් 50%ක මුදල් හෝ අමුද්‍රව්‍යමය දායකත්වයක් සනාථ කරන සාක්ෂි ලබාදීම (5%).
9. පාරිසරික තිරසාරත්වය සඳහා කැපවීමක් සාරාංශ කිරීම (5%).



# බහු වාර්ෂික ප්‍රදාන – 2026 සිට 2029

## හවුල්කාරිත්ව ප්‍රදාන

**මොනෑෂ් ප්‍රදේශයේ ක්‍රියාත්මක වන විශේෂඥ සේවා සංවිධාන හෝ ප්‍රධාන උත්සව සංවිධායකයින් සඳහා.**

» $85,000 දක්වා මුදල් ප්‍රදානයක් සඳහා අයදුම් කරන්න.

## හවුල්කාරිත්ව ප්‍රදාන නිර්ණායන

1. සාක්ෂි මත පදනම් වූ ප්‍රජා අවශ්‍යතාවයක් ආමන්ත්‍රණය කිරීම (15%).
2. කවුන්සිලයේ සෞඛ්‍යය සහ සුබසාධන සැලසුමට අදාලව (15%).
3. ප්‍රයෝජනය ලබන මෝනෑෂ් වැසියන් සංඛ්‍යාව (10%).
4. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානයේ හැකියාව (15%).
5. සම්පූර්ණ ව්‍යාපෘති සැලැස්මක් ලබාදීම (5%).
6. කවුන්සිලය හෝ මොනෑෂ් හි අනෙකුත් ආයතන සමඟ ඇති සහයෝගිතා සනාථ කරන සාක්ෂි (10%).
7. ආර්ථික ප්‍රතිලාභය (5%).
8. අයවැය වියදම් (10%).
9. කවුන්සිලය මගින් ලබාදෙන අරමුදල්වලින් එහා තිරසාරත්වය සඳහා පෙන්වන හැකියාව (5%).
10. ව්‍යාපෘතිය සඳහා මුදල් හෝ අමුද්‍රව්‍යමය දායකත්වයක් සනාථ කරන සාක්ෂි ලබාදීම (5%).
11. පාරිසරික තිරසාරත්වය සඳහා කැපවීමක් සටහන් කිරීම (5%).

## ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගම් සහාය.

» $5,000 දක්වා මුදල් ප්‍රදානය.

» $30,000 දක්වා ශාලා කුලියට ගැනීමේ සහාය

» ප්‍රොබස් කණ්ඩායම් සඳහා $500 දක්වා මුදල් සහාය ලබාදේ.

» ආහාර/කෑමබීම සැපයීමේ වියදම් සඳහා 75%ක් දක්වා වියදම් කළ හැකිය.

» මුදල් සහාය, කණ්ඩායම තුළ සිටින මොනෑෂ් වැසියන්ගේ සංඛ්‍යාව මත පදනම් වේ (පහත වගුව බලන්න).

| මොනෑෂ් සාමාජිකයින්ගේ සංඛ්‍යාව | ලබා ගත හැකි මුදල් සහාය |
|---|---|
| **201 හෝ ඊට වැඩි** | $5,000 |
| **151 to 200** | $4,000 |
| **101 to 150** | $3,000 |
| **51 to 100** | $2,000 |
| **20 to 50** | $1,000 |

## මොනෑෂ් ශාලා සහනාධාරය

» කවුන්සිලයට අයිති ශාලා සඳහා $5,000 දක්වා කුලියට ගැනීම සඳහා අයදුම් කළ හැකිය.

» කවුන්සිලය අයිති නොවන ශාලා කුලියට ගැනීම සඳහා වාර්ෂිකව මුදල් අරමුදලක් සඳහා අයදුම් කළ යුතුය.



# වසර පුරා අරමුදල් ලබාදීම

**2026/27 මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක වීමට නියමිත ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීම 2026 ජූලි 1 සිට 2027 මැයි 12 දක්වා, හෝ අරමුදල් අවසන් වන තෙක්, විවෘතව ඇත.**

## සංස්කෘතික උත්සව සඳහා සහනාධාර

- $1,000 දක්වා අයදුම් කළ කරන්න.
- කුඩා ප්‍රජා කණ්ඩායම් උත්සව.
- ආහාර, අලංකරණ සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් වැනි දෑ සඳහා අයදුම් කරන්න

## ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන

- $5,000 දක්වා අයදුම් කළ කරන්න.
- ABN සහිත සංස්ථාගත ආයතන හෝ තනි කලාකරුවන්ට අයදුම් කළ හැකිය.
- වාර්ෂික අරමුදල් චක්‍රයට බාහිරින් ප්‍රජාවේ අදහස් සහ අවශ්‍යතා වලට ප්‍රතිචාර දක්වන ව්‍යාපෘති සඳහාය.
- එක් ව්‍යාපෘතියක් සඳහා එක් වරක් පමණක් අයදුම් කරන්න.
- කුඩා ප්‍රදාන සඳහා ඇති නිර්ණායකම මෙයට අදාළ වේ.



# අයදුම්පතක් ඉදිරිපත් කිරීම

අයදුම්කරුවන් තමන් අයදුම් කිරීමට බලාපොරොත්තු වන අරමුදල් ප්‍රවාහයට අදාළ අයදුම්පත්‍රය භාවිතා කළ යුතුය. එම අයදුම්පත්‍ර SmartyGrants ඔස්සේ මාර්ගගතව ඉදිරිපත් කළ හැකිය.

2026/27 MCGPP වටයේ අයදුම්පත් **2026 ජනවාරි 27 වන අඟහරුවාදා උදෑසන 9 සිට 2026 මාර්තු 3 වන අඟහරුවාදා දවල් 2 දක්වා**. විවෘතව ඇත. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් සුදුසුකම් නොලබන ලෙස සැලකේ.

SmartyGrants මාර්ගගත අයදුම් පද්ධතිය ඔබට අයදුම්පත් සුරැකීමට, සංස්කරණය කිරීමට සහ මුද්‍රණය කිරීමට ඉඩ සලසයි. උපකාරක ලියකියවිලිද ඔබේ මාර්ගගත අයදුම්පතට ඇමිණිය හැකිය.

**මතක් කිරීම!**

**2026/27 අයදුම්පත් 2026 ජූලි 1 සිට 2027 ජූනි 30 දක්වා ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ලබාදේ.**

## අත්‍යවශ්‍ය ලියකියවිලි

ඔබේ අයදුම්පත සමඟ ඇමිණිය යුතු ලියකියවිලි:

- ✓ ABN අංකය.
- ✓ සංස්ථාපිත අංකය.
- ✓ නවතම මූල්‍ය ප්‍රකාශන (ආදායම් ප්‍රකාශය, ශේෂ පත්‍රය සහ මුදල් ප්‍රවාහ පත්‍රය).
- ✓ ළමුන් සමඟ වැඩ කිරීමේ පරීක්ෂණ.
- ✓ මොනෑෂ් අයත් ශාලා සඳහා සහාය අයදුම් කරන්නේ නම්, මොනෑෂ් ශාලාවලින් ලබාගත් මිල අනුමානය/ඇස්තමේන්තු. ශාලා කුලියට ගැනීමේ ගිවිසුම් පෝරමය පිළි නොගන්නා බව කරුණාවෙන් සලකන්න.
- ✓ කවුන්සිලයට අයත් නොවන ශාලාවක් සඳහා මුදල් අයදුම් කරන්නේ නම්, එම ශාලාව සඳහා වෙන්කිරීමේ තහවුරු කිරීම.
- ✓ කෙටුම්පත් ව්‍යාපෘති සැලැස්මක් (විශාල ප්‍රදාන සහ හවුල්කාරිත්ව ප්‍රදාන සඳහා වන අයදුම්කරුවන්).
- ✓ ස්ථාන සැලසුම් සහ අවදානම් කළමනාකරණ සැලසුම් ඇතුළත් කෙටුම්පත් උත්සව කළමනාකරණ සැලැස්මක් (උත්සවයකට හෝ පිටත ක්‍රියාකාරකමකට අයදුම් කරන්නේ නම්).

**monash.vic.gov.au/commmunty-grants ඔස්සේ අයදුම් කරන්න:**

CITY OF
MONASH

මොනෑෂ් සිවික් මධ්‍යස්ථානය | 293 Springvale Road, Glen Waverley, 3150 | පෙව 8.30 සිට පව 5.15 දක්වා | සඳුදා සිට සිකුරාදා දක්වා
ඔක්ලි සේවා මධ්‍යස්ථානය | 3 Atherton Road, Oakleigh, 3166 | පෙව 8.30 සිට පව 5.15 දක්වා | සඳුදා සිට සිකුරාදා දක්වා
9518 3555 | www.monash.vic.gov.au | mail@monash.vic.gov.au
ජාතික රිලේ සේවාව (ඇසීමේ හෝ කථනයේ අබාධිත පුද්ගලයන් සඳහා) 1800 555 660

## මොනෑෂ් භාෂණ පරිවර්තන සේවාව

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 普通话 | 9321 5485 | Ελληνικά | 9321 5482 | 廣東話 | 9321 5481 | සිංහල | 7005 3002 | Italiano | 9321 5483 |
| हिंदी | 7005 3000 | Việt Ngữ | 9321 5487 | தமிழ் | 7005 3003 | 한국어 | 9321 5484 | Bahasa Indonesia | 7005 3001 |